භාරතගේ දියණිය හිරුණිකාගෙන් ජනාධිපතිට ලිපියක්

ගරු ජනාධිපතිතුමනි

මගේ පියා මට අහිමි වී දැනට මාස 7 කුත් දින 11 කුත් පමණ වෙනවා. මගේ දින පොතේ 2011.10.08 වැනි දින මා සටහන් කර ඇත්තේ ‘The Day I Lost My Soul යනුවෙන්. සත්‍යවශයෙන්ම මීට මාස 7 කුත් දින 11 කලින් මාගේ ආදරණීය පියා මට අහිමි වුණේ මාගේ ආත්මය පමණක් නොවෙයි මාගේ ජීවත්වීමේ අරමුණද අහිමි කරමිනුයි. ‘මැරෙන්නට කාටත් පුළුවන් ජීවත් වෙන එකයි අමාරු’ මගේ පියා හැමදාම ප්‍රකාශ කළ දෙයක්. තාත්තා නැති වුණ දා සිට අද වනතෙක් මැරෙන්නට සිතුන වාර අනන්ත වුවත් හැමදාම ඒ දේ වළකින්නේ තාත්තාගේ මූණ මගේ ඇස් දෙක ඉදිරියට පැමිණ ජීවත් වන්නට තියෙන අමාරුකම කියන නිසයි. පසුගිය මාස 7ට පියකු අහිමි වුණ දියණියකට මුහුණ දෙන්නට සිදුවෙන සියලුම දුක්, වේදනා, ගැරහිලි, මඩ, තර්ජන, ගර්ජන සියලු දේටම මම මුහුණ දුන්නා. තවමත් මුහුණ දෙනවා. මෙතෙක් මගේ ජීවිතේ මම මුහුණ දුන් දුක්ඛදායි, කටුකම අත්දැකීම එයයි. තාත්තාගේ මරණයෙන් පස්සේ ඒ සමගම පැටලී එන චරිත ඝාතන, මරණ තර්ජන කටකතා මඩ මේ සියල්ලක්ම මට එතරම් නොදැනුනේ මගේ ජීවිතේ මට වුණ ලොකුම පාඩුව මට සිද්ධ වුණු නිසා.

මේතරම් මට අසාධාරණකම් සිද්ධ වෙන්න හේතුව කුමක්ද? තාත්තාගේ මරණින් පස්සේ ඒ සමගම පැටලී එන මේ අනෙකුත් ගැටලු මට එල්ලවී ඇත්තේ හුදෙක්ම මං මගේ තාත්තාට සාධාරණය හොයා යන ගමන නිසා නොවේද? මා කරන්නේ වැරැද්දක්ද? සාධාරණය සොයා යනවා හැරෙන්නට මට කළ හැක්කේ කුමක්ද?

ජනාධිපතුමනි, ඔබේ පවුලට සමීපතම පවුලක්ව සිටි කාලයේ ඔබතුමාට මතක ඇති මාගේත් මගේ පියාගේත් තිබූ සම්බන්ධය කුමන එකක්ද කියා. ඔබ මේ ළඟදී දවසක අපගේත් ඔබේත් සමීපතමයකුට පවසා තිබුණා., ඔය කෙල්ල ඔහොම හැසිරෙන එක සාධාරණයි, මම දන්නවනේ භාරත ඔය කෙල්ලට කොච්චර ආදරෙන් හිටියද කියලා. England වලට බස්සලා එනකොට භාරත Flight එකේ එනකං අඬ අඬා ඇවිත් තියෙන්නේ’ යනුවෙන්. ඒ කතාව සම්පූර්ණ සත්‍යයක්. Flight එකේ එන ටිකට පමණක් නොව අම්මා කිවූ ආකාරයට ගෙදර ඇවිත් දවස් දෙක තුනක් යනකං හූල්ල හූල්ලා ඉඳලා තියෙනවා. මගේත් මාගේ ආදරණීය පියාගේත් අතර තිබූ වචනයෙන් විස්තර කළ නොහැකි ඒ ආදරය සෙනෙහස මේ නිවසට ආව ගිය සියලුම ජනතාව දැක තිබෙනවා. ඒ නිසා තමයි තාත්තා නැති වුණ ආරංචිය කන වැටුන විගස බොහෝ අය ර්ළඟට අහපු ප්‍රශ්නය වුණේ දුවට කොහොමද බලන්න කියන එක සියලු දෙනාම හිතුවේ මට පිස්සු හැදෙයි, එසේත් නැත්නම් මම සියදිවි හානි කරගනී කියායි. මට මතකයි 2011.10.08 දින මා නිවසේ ඡන්දය ප්‍රකාශ කරන්න යන්න ලෑස්ති වෙද්දී දුරකතන ඇමැතුමක් පැමිණ කියා සිටියේ මුල්ලේරියාවේ වෙඩි තියාගන්නවා දුමින්ද සිල්වා, ලකී අයියත් එතන ඉන්නවා. පොඩ්ඩක් හොයලා බලන්න යනුවෙනි.  මාගේ තාත්තා මරණයෙන් බේරුණු අවස්ථා අනන්තයි අප්‍රමාණයි. මාගේ පියා පළමුවෙන්ම ඝාතනය කරන්නට ආවේ මට වයස මාස 8ක් වූ ළදැරියක්ව සිටියදී. 1988 දිනයක හවස්වරුවක පවුලේ සියලු දෙනාම රූපවාහිනී නරඹන අතරතුර ලකී අයියේ ලකී අයියේ යනුවෙන් ආමන්ත්‍රණය කළ යම්කිසිවකු දොර අරිත්ම T 56 ආයුධය අතදරා සිටින බව දුටු මාගේ සීයා එදා ඒ දුම් බටය ඔහු සමඟ පොරබැඳ පොළවට ඇල්ලූ නිසා යන්තම් තාත්තාත් තාත්තාගේ ඔඩොක්කුවේ සිටි මාගේත් ජීවිතය බේරිණි. ඉන්පසු පළාත් සභා ඡන්දවලදී ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය විපක්‍ෂය වශයෙන් සිටියේදී මරණය පෙනි පෙනී මගේ පියා පක්‍ෂය වෙනුවෙන් නොසැලී සිටියා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට දෙවන වරට ජනාධිපතිනිය වන්නට තිබූ අවසන් රැස්වීමේ කොටි බෝම්බයකින් යන්තමින් ජීවිතය බේරා ගත්තා. මට මතකයි එදා තාත්තාගේ සුදු National එකේ ලේ පැල්ලම් හැමතැනම මිනී ඇදලා ජනාධිපතිනිය රෝහලට යවලා නිවසට එද්දී හරියටම උදේ 7යි. මම පාසල් යන්න ලෑස්තිවෙලා එළියට බහිද්දී දැක්කේ මගේ තාත්තා ලේ පිරිච්ච ඇඳුමක් එක්ක නිවස ඇතුළට එනවා. මං බයවෙයි කියලා කොහෙද සුපුරුදු හිනාව මුහුණ දරාගෙන දුව අද කලින්ම පිටත් වෙන්නේ මොකද කියාගෙනම නිවස ඇතුළට ඇතුල්වුණේ, මාගේ බියගැන්වුණ සිත හැඳීමට කියා මා එවලේම දැනගත්තා මෙවරත් තාත්තට වෙඩි වැදිලා ජාතික General Hospital එකට ගෙන ගියා කියන ආරංචියෙන් මම මදක්වත් කලබල නොවුණේ, හැමදාම මරණින් බේරුන

මගේ තාත්තා අදත් හීනාවෙවී මං ළඟට ඒවි කියන බලාපොරොත්තුවෙන්. එහෙත් ටික ටික රෝහලට ළංවන විට මිනිසුන්ගේ හැසිරීම දැකලා මොහොතකට හිත ගැස්සුනත්, තදින්ම හිතේ කා වද්ද ගත්තා මගේ තාත්තා කොයි මොහොතේ හෝ මෙතනට සිංහයෙක් වගේ ඒවි කියා. මොහොතකින් අපේ රියැදුරුට දුරකතන ඇමැතුමක් ආවා සර් මෝචරියට ගෙන ගිහින් කියලා. රියැදුරු එතනම සිහි මූර්ජා වුණා. ඒත් මගේ හිතට මගේ තාත්තා මාව දාලා ගියානේද යන වග මොහොතකටවත් ආවේ නැත. කෙසේ හෝ මෝචරියට යනතෙක්ම හිත පිළිනොගත් නිසා එහි ගිය පසු මගේ තාත්තාව මට පෙන්නන්න කියා ඉල්ලුවත් කිසිම කෙනෙක් මට මගේ තාත්තාව පෙන්නුවේ නෑ. ගෙදරට ඇවිත් අහම්බෙන් වගේ ප්‍රවෘත්තිවල මගේ තාත්තා ලේ විලක් මැද වැටී සිටින ආකාරය දුටු විට මට මාවම පාලනය කරගත නොහැකි වුණා. මට බෙරිහන්දී අඬන්න ඕනේ වුණා, කෑගහන්න ඕනේ වුණා. ඒ මගේ හඬ පිට වුණේ නෑ. ඉන්පස්සේ මම මගේ යාළුවන්ට කිව්වා මාව මුහුදක් ළඟට එක්ක යන්න කියලා මම එතනට ගොස් මගේ දුක මුළු විශ්වයට මුදා හැරියා. මම වැලපුණා කෑ ගැහුවා, ඇඬුවා, කඳුළු ඉවරවෙනකම්ම ඇඬුවා. නැවත නිවසට ඇවිත් ඊට කලින් දවසේ මගේ තාත්තා ඇඳපු කමිසය ළං කරගෙන ඔහුගේ උණුහුමට ළං වුණා යැයි හිතාගෙන මං නිදාගත්තා. ඒ දවස හරියට හීනයක් වගේ නැවත පැයකින්, දෙකකින් පමණ කවුරුන්ගේ හෝ ළතෝනියක හඬ වැකී මං හදිසියේ අවදි වුණා. තත්පර ගණනක් යනකං මට සිහිය ආවේ නෑ.

ජනාධිපතිතුමනි, මාගේ පියාගේ භූමදාන දිනයේ මං අවසාන වශයෙන් කළ කතාව ඔබතුමාගේ හිතරිදුන බව ඔබගේ දුරකතන සංවාදයෙන් පසුව මට වැටහුණා. එදා වගේම අදත් මං ප්‍රකාශ කරන්නේ එම කතාවෙන් මා කිසිසේත්ම ජුලියස් සීසර් මියගිය විට ඔහුගේ සහෝදරයා කළ කැරැල්ල වගේ කැරැල්ලක් කිරීමටවත් වෙනයම් ආකාරයක ආණ්ඩු විරෝධී ක්‍රියාමාර්ගයකටත් මගේ අභිප්‍රාය නොවූ අතර මගේ ජනතාවම නැගී සිටිමු කීවේ නැවතත් මෙවැනි අසාධාරණයක් කිසිම පුද්ගලයකුට නොවීමටත් ලකී අයියා යන ඔහුගේ සහෘදයාගේ මරණයට වග කිව යුත්තන් නීතිය ඉදිරියට ගෙනඒමට ජනතාව එකා මෙන් නැගී සිට ගැනීමට අත්‍යවශ්‍ය බැවිනි.

ජනාධිපතිතුමනි, 2008 මා ඔබට ලියූ ලිපියක ලිපියේදී එක් තැනක සටහන් වෙලා ඇයි ඔබ තුමාට කම්කරු ඇමැති සිට ජනාධිපතිවරයා වනතෙක්ගෙන ඒමට නොමඳ සහයක් දුන් මගේ පියාණන්ට මෙහෙම වුණේ කියා. මා එහි සඳහන් කලා මාගේ පියා අවලංගු කාසියක් බවට පත්වීම වැළැක්විය හැක්කේ ඔබට පමණයි කියායි. තවද මා සටහන් කලා දුමින්ද සිල්වා කොළොන්නාව සංවිධායකවරයා කරවීමට ඔබ හුදෙක් මගේ පියාණන්ව අවලංගු කාසියක් බවට පත් කරලීමට මුල පිරීමක් සහ මහා සටනක ආරම්භයක් බව. දුමින්ද සිල්වා යනු, දේශපාලනය මුදල්වලට වෙන්දේසි කළ පුද්ගලයකු බව අද මුළු රටට දන්නා කාරණයක්. දුමින්ද සිල්වා Kushmi කෑම කඩයෙන් පටන්ගෙන අවුරුදු 10 වැනි කෙටි කාලයක් තුළදී පළාත් සභා ඡන්දයේදී මිලියන ගණනක් වියදම් කිරීම දක්වා ගමන නිසැකෙන්ම අද මුළු රටටම සැක සහිත කාරණයක්. දුමින්ද සිල්වලාට එක නීතියකුත් මේ රටේ අනෙක් ජනතාවට එක නීතියකුත් බලපාන්නේ ඇයිද කියා මා ඔබතුමාගෙන් අහන්නට කැමැතියි.

80 දශකයේ සිට මගේ පියාගේ දේශපාලන ගමන කුමන එකක්ද කියා කොළොන්නාවේ ජනතාව පමණක් නොව මුළු රටම දන්නා කරුණකි. 79 UNP ආණ්ඩු රජයන කාලේ ශ්‍රී ලංකා මිනිස්සු ගෙවල්වලින් එළියට එන්න බියවී සිටි කාලයේ ඒ තර්ජන ගර්ජන මැද බිය නොවී ජනතාව එක්රැස් කර පාරට බස්සා නිල් කොඩියක් පලවෙනියට කොළොන්නාවට දැම්ම එකම නායකයා මගේ පියායි. කළු සල්ලි නොතිබුණත් උගුර ලේ රහ වෙනතෙක් මේ රටේ වැඩකරන ජනතාව සමඟ පාරට බැස, සෙරෙප්පු කැඩෙන කං පාගමන් ගොස් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිනවන්නට මගේ තාත්තා කළ කැපවීම දැන් ඉන්න අලුත් දේශපාලනඥයන් නොදන්නවා වුණාට පරණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ය සාමාජිකයන් හොඳටම දන්නා කාරණයක්. මගේ පියාට මෙවැනි මරණයක් අයිති වෙනවා නම් අයිති වන්නට තිබ්බේ ඒ අඳුරු යුගයේ. දේශපාලනයේ රුදුරු යුගය අවසන් කර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජයග්‍රහණය සනාථ කිරීමෙන් පසු මොන ආණ්ඩු රජයන්නට ආවත් මොන නායකයින් වෙනස් වුණත් මොන අසාධාරණකම්වලට මුහුණ දුන්නත් මගේ පියා කෙදිනකවත් පක්ෂය හැරගිය අයෙක් නොවේ. ඇත්ත ඇති සැටියෙන් කීමත් අයුක්තියට හිස නොනැමීමත් නිසා සමහර ලොකු තැන් මගේ

පියා දඩබ්බර, හිතුවක්කාරයෙක් කියා සිතුවත් සාමාන්‍ය වැඩ කරන ජනතාව සදා ආදරය කළේ මගේ පියාගේ නොනැමෙන ගති ස්වභාවයටයි.

මගේ පියා නිග්‍රහ කිරීමට දැවැන්ත පරිශ්‍රමයක් දුමින්ද සිල්වා සහ සමහර උදවිය උත්සාහ ගත්තද, ඔවුන්ට එතැනින් එහාට කිසිවක් කළ නොහැක්කේ ඒ කිසි දෙයක් ඔප්පු කිරීමට ඔවුන්ට නොහැකි නිසාත්, කවුරුත් නොසිටියත් සත්‍ය ඉදිරියේ ලෝකපාලක දෙවියන් සිටින නිසාත්ය. මගේ පියා චණ්ඩියෙක් යැයි හංවඩු ගැහුවද මගේ හිත මොහොතකටවත් නොසැල්ලෙන්නේ අද රටේ නිර්භීත පුද්ගලයා හඳුන්වන්නේ චණ්ඩියා යනුවෙන් කියායි මා හිතට පසක් කරගෙනය. මගේ ව්‍යවහාර භාවිතාවේ චණ්ඩියා යනු අහිංසක ජනතාව වෙනුවෙන් නැඟී සිටින, යුක්තිය ඉදිරියේ හිස නමන අයුක්තිය ඉදිරියේ පහරින් පහර ගසන මුදල් බලයට නොසැලෙන නිර්භීත මිනිසෙකි. ඒ මාගේ පියායි. මගේ පියාත් නිර්භීතකම නිසාමයි එදා වුවත් ආයුධ අතදරා සිටින පිරිවරක් රැගෙන නොගොස් හිස් අතින් ඉදිරියට ගියේ. ඔහු ඉදිරියේ T 56 අමෝරා සිටින 20, 30 සිටින විට මොහොතකටවත් නොසැලී තනිවම ඉදිරියට ගියේ එදා මරණයට බිය නොවන සිංහයකු නිසායි. මරණයට බය හිවල්ලු තම සහචරයන් රාශියක් සමඟ අවි අමෝරා සිටියදීත් මාගේ පියා  අවසානයේ සිනහව මුවඟ රඳවාගෙන සිංහයකුමෙන් මිය ගියේ නිර්භීත ජනනායකයකු නිසා වෙනි.

මාස 7ක් තිස්සේ මා හැමදාම කන්නලව්වක් සේ කියා සිටින්නේ ප්‍රධාන සැකකරු නීතියේ රැහැනට ගෙන එන්නට කියායි. නිවසට යන එන විශාල පිරිසක් මා හට පවසන්නේ දුව කොහොමද ඔයා තනියම සටන් කරන්නේ, කළු ගලේ ඔළුව හප්පගන්නේ ඇයි යනුවෙනි. ඔවුන් කළු ගල ලෙස සඳහන්  කරන්නේ ඔබතුමාවයි. මා මේ නඩුව ආරම්භයේ සිටම මේ මොහොත දක්වා ඔබතුමා සමඟ පෞද්ගලික කොන්ත්‍රාතුවක් විසඳීමට කිසිසේත්ම උත්සාර කරන්නේ නැත. මෙය හුදෙක් දෙපාර්ශ්වයක් අතර ඇති වුණ වෙඩි තැබීමකින්, ඔබතුමා සමඟ 80 ගණන්වල සිට සෙවනැල්ලක් සේ ඔබතුමාගේ දේශපාලන ගමනේ සිටි සහෘදයකුගේ මියයෑම සහ 2007 තම පෞද්ගලික වාසි සඳහා විපක්ෂයේ සිට ආණ්ඩුවට පැන යහමින් නීති විරෝධී ජාවාරම් කරමින් තරුණ ජීවිත විශාල ප්‍රමාණයක් ආගාධයකට දමමින් මැර බලය තම දේශපාලන පාඨය කරගත් මිනීමරුවකු සියලුම වගකිවයුතු පාර්ශ්වයක් බේරා ගැනීම වැලැක්වීමට මා දරන තනි උත්සාහයකි. අද මගේ පියා බේරී වෙනත් පරණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකයකුට මේ සිද්ධියට මුහුණදීමට සිදුවුණානම් මගේ පියා රට උඩුයටිකුරු කර හමාරය. ඒත් අද පරණ සාමාජිකයන්ට කරබාගෙන දෙන දේ කා වෙන දේ බලා සිටීමට හැර වෙන කළ හැකි දෙයක් නැත.

දැන් දැන් මේ නඩුව භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර පාර්ශ්වය සහ දුමින්ද සිල්වා ඇතුළු රටේ වගකිව යුතු පාර්ශ්වයන් අතර කෙරෙන නඩුවක් වී හමාරය. CID සිට සියලුම උසස් නිලධාරීන් ඇතුළු වගකිව යුතු සියලුම පිරිස් දුමින්ද සිල්වාට පක්ෂපාතී ලෙස මෙම නඩුවට විනිශ්චය කරමින් පවතින බව අද මුළු රටම දන්නා කරුණක්. භාරත ලක්ෂ්මන් වෙනුවෙන් සටන් කරන්නේ පවුලේ උදවිය ඇතුළු නීතිඥ පිරිස පමණි.  මට නොවැටහෙන කාරණාව වන්නේ එදිනෙදා මාධ්‍ය හා නඩුවාරවලදී ප්‍රකාශ වන අන්දමට දුමින්ද සිල්වා මන්ද මානසිකත්වයෙන් පෙලේ නම් ඔහු බේරාගෙන පාර්ලිමේන්තු කාලය අවසන් වන්නට පෙර නිදහස් කිරීමේ ක්‍රියාදාමයක සියලු දෙනා පොරකන්නේ ඇයිද යන්නයි. ඔහුව නිදහස් කළත් මන්ද මානසිකත්වයෙන් පෙලෙන්නෙකුට පාර්ලිමේන්තුවට නැවත ඉදිරිපත් වීමට හැකිද? එසේත් නැත්නම් ඔහුගේ මානසිකත්වය කෙදිනකවත් යථා තත්ත්වයට පත් වන්නේ නැති බවට කටකතා පතුරුවා බලාපොරොත්තුවන්නේ ජනතාවගෙන් අනුකම්පාවක්ද? ඒ කෙසේවත් මට වැටහී යන කාරණාව නම් දැන් මැරුණ කෙනා මැරුණා ඉන්න කෙනා බේරා ගන්න ඕනේ යන තීරණය සියලුම වගකිව යුතු පාර්ශ්වයන් තීරණය කර හමාරය.

ජනාධිපතිතුමනි, මැරුණ කෙනා මැරුණා බව ඇත්තය. ඒත් මැරුණ කෙනාගේ පවුල තවමත් ජීවත්වේ. මැරුණ කෙනා මේ රටේ ජනතාවට අමතක නොවන කාර්ය භාර්යක් කළ පුද්ගලයෙකි. විශේෂයෙන් ඔබතුමාට අමතක වී ඇති අපට තවම මතක ඒ ඉතිහාසය මඳක් සිහිපත් කරන්නම්. ඔබට මතකද ඔබතුමා සමඟ මාගේ පියා තිලක් මාමා, සුමිත් මාමා සහ මූර්ති මාමාගේ කල්ලිය එකා මෙන් සහෝදරත්වයෙන් ඔබතුමාගේ දේශපාලන ගමන මුල සිට ආ හැටි. මට මතකයි ඔබතුමා කම්කරු ඇමැතිව සිටියදී හදිසි ඇමැති සංශෝධනයකින් ඔබව ධීවර ඇමැති බවට පත් කළා. ඔබ සිටියේ

විදේශ ගතව, ඔබතුමා අපේ පියාට කතා කරලා කිව්වා මල්ලි බලන්නෝ මේ ආසාධාරණය මම කම්කරු එකේ කොච්චර හොඳට වැඩ කරගෙන ආවාද? කම්කරු අමාත්‍යංශය හොඳට වැඩ කරගෙන ආවා විතරයි මට ධීවර ඇමැති දුන්නනේ. මට නම් එපා වෙලා තියෙන්නේ එවිට මගේ පියා කීවා, අයියේ බය නැතුව එන්න මං හැමදේම බලාගන්නං කියා. මගේ පියා එවලේම දන්නා කියන සියලුම මිතුරන්ට කතා කළා. එක දවසින් මුළු කොළඹම සැරසුවා ඔබතුමා පිළිගන්න. මගේ පියාට ඕනෑ වුණේ ඔබතුමාගේ හිත හදලා මොනදේ වුණත් කොළඹ ජනතාව ඔබතුමාට ඉන්නවා කියලා පසක් කරන්න. ඔබතුමා ජනාධිපති දක්වා පැමිණි ගමන ඉතාමත් දුෂ්කරයි. එය මල් වට්ටියක තියා ඔබට දුන්වරමක් නොවේ. ජනාධිපති පුටුවට යන්න පහු කරන්නට තිබෙන අනෙකුත් කඩුලු පනින්නට ඔබතුමාට පහසු කාර්යක් වුණේ නෑ. ඔබතුමා විපක්ෂ නායක පුටුවට ගේන්න මුළු පක්ෂයෙන්ම නැගිටලා කතා කරන්න හිටියේ මගේ පියා පමණයි. ශ්‍රීපති සූරියආරච්චි මහතා ඔබතුමාට අනවශ්‍ය ආකාරයට දොස් කිව්වා කියා පාර්ලිමේන්තුවේදී ඔහු සමඟ දබර වුණා. ඉන්පස්සේ මට මතකය, ඔහු අපේ නිවසට ඇවිත් සිටියා තාත්තිගෙන් සමාව ගන්න. ඔබතුමාට අගමැතිකම දෙන්න යනවා කියලා ආරංචිය දැනගත් විගස අපේ පියා හැසිරුණේ හරියට ඔහු විශාල ජයග්‍රහණයක් ලබාගත්තා වගේ. මට මතකයි එදා අපේ අම්මා දුරකතනයෙන් ඔබතුමාට විනාඩි 5න් 5ට කතා කරමින් ඇහුවා අයියේ මොකද වෙන්නේ කියලා. ඉන්පසන්සේ ඔබතුමා එතනට යන විට ලක්ෂ්මන් කදිරගාමර් මහත්මයාට අගමැතිකම දෙන්න තීරණය කරලා හමාරයි. ඔබ හැරෙන තැපෑලෙන් ආවේ අපේ නිවසට එනවිට මට මතකයි මගේ පියා කිව්වේ අයියේ කලබල වෙන්න එපා ලැබෙන්නේ අයියට ඉවසීමෙන් ඉමු කියලා. ඉන්පස්සේ දවසේ ඉඳන් මගේ පියා ඔබට අගමැතිකම ගන්න, සටන් කලා රැස්වීම් තිබ්බා සෑම උදව් ගත හැකි හැම පුද්ගලයෙක් එක්කම සාකච්ඡා කළා අවසානයේ විශාල මහන්සියක ප්‍රතිඵලයක් ලෙස ඔබතුමා රටේ අගමැති පුටුවෙත් ඉඳ ගත්තා. ඔබතුමාගේ ඔය ගමනට මගේ තාත්තා වගේම අපේ මුළු පවුලට ආශිර්වාද කළා. මට මතකයි දවසක් අපේ අම්මත්, ශිරන්ති ආර්යාවත් ජනාධිපති මැදුරට උත්සවයකට ගිය විට අපේ අම්මා ජනාධිපති මැදුර දිහා බලාගෙන මැඩම්ට කිව්වා කවදාහරි දවසක ඔයාලාට මෙතන පදිංචියට එන්න ලැබෙනවා නම් මොනතරම් දෙයක්ද කියලා. ඔබතුමාගේ පළමු ඡන්දයේ මම හිටියේ ලංකාවේ. මට මතකයි මගේ පියා ඡන්දවලවත් කැන්වසින් යන්න මිසක් මට රෑට පෝස්ටර් ගහන්න යන්න මගේ පියා අවසර දුන්නේ නෑ. ඒත් ඔබේ ඡන්දේ මමත් මගේ පියා එක්ක පෝස්ටර් ගහලා බැනර් එල්ලලා එද්දී රෑ 2, 3යි. ඔබතුමා ජනාධිපති වෙනවිට අවාසනාවන්ත ලෙස මගේ පියා ඡන්දය පැරදිලා සිටියේ. හැබැයි ඒකට හේතුවක් තිබුණා. ඒ ශ්‍රීල.නි.ප.ය ජේ.වී.පී. එකත් එක්ව එකතු වෙලා ඡන්දය ඉල්ලපු නිසයි. තාත්තා කිව්වා සන්ධාන ගත වුණොත් ශ්‍රීල.නි.ප. මන්ත්‍රීධුර විශාල ගණනක් අඩුවෙයි කියලා ඒක එහෙමම වුණා.

ඡන්ද 2000ක් ගත් අය ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට යද්දී මගේ පියා කරබාගෙන ජනාධිපති වෘත්තීය සමිති අධ්‍යක්ෂ ජනරාල් තනතුර කරගෙන සිටියේ ඔබතුමා හරිකාලෙට හරි තනතුරක් මගේ පියාට දේවි යන බලාපොරොත්තුවෙන්. සමහර උදවිය ඔබතුමාගේ ඡන්ද කාලේ රට හැර යද්දී ඔබ ජනාධිපති වූ පසු පැමිණි ගමන් ඇමැති පට්ටම් ගද්දී පවා මගේ පියා ඉවසාගෙන සිටියේ, වෙලාවට ඉඩ දෙමින් පසුව ඔහුට අයත් බොරැල්ල ආසනයද වෙනුවෙන් ඉවත් කරද්දීත් ඔබ ඉවසගෙන සිටියා. අවසාන වශයෙන් ඔහුගේ ගම වන කොළොන්නාව, අලුතෙන්ම කරලියට පැමිණි දුමින්දට දුන්නා. ලකී අයියා ඒත් කරබාගෙන සිටියා. මම දවසක් ඇහුවා ඇයි තාත්ති මෙච්චර අසාධාරණකම් වෙන්නේ තාත්ති අතින් වුණ අඩුපාඩුව කුමක්ද කියා. මට මතකයි දිනක් ඔබ 2004දී විපක්ෂ නායකව අපේ පියාට පුද්ගලයෙක් පැවැසුවා භාරත ඔයා වැරදි මිනිහත් එක්ක හිටගෙන ඉන්නේ, එයා පුළුවන් තරම් උදව් අරගෙන ආයේ පැත්තවත් බලන්නේ නෑ. මෝඩ වැඩ කරන්න එපා කියලා. ඒ කියපු දේ හොඳට අසා ඉඳලා ඊළඟ දවසේ මගේ පියා කළේ ඒ කියපු පුද්ගලයට පේන්න ඔබතුමා ළඟටම වෙලා හිටියා. මගේ පියා ඔබව ඉතාමත් විශ්වාස කළා. මොන අසාධාරණකම් පක්ෂය තුළ සිදු වුවත් කරබාගෙන ඉවසගෙන හිටියේ උඩ බලන් කෙළ ගැහැවොත් වැටෙන්නේ තමන්ගේ මුහුණටම නිසා. කුමන අසාධාරණකම් සිදුවුවත් ප්‍රතිපත්ති පවා නොදී හැමදාම පක්ෂය එක්කම සිටියහ. අන්තිමේදී පක්ෂය වෙනුවෙන් ඔබතුමා වෙනුවෙන් මෙතරම් දර දිය ඇද්ද මාගේ පියා

පිට පක්ෂයකින් පැමිණි කුඩු සල්ලාලයෙක්ගේ අතින් මැරුම් කෑවා.

ජනාධිපතිතුමනි. මා මෙහි සඳහන් කළ සමහර කරුණුවලට ඔබතුමාගේ හිත රිදෙන්නට පුළුවන් ඒත් මගේ හිත රිදෙන්නේ ඒ හා සමානව 1000 ගුණයකින් වැඩියෙන්. දවසින් දවසට කල් යමින් වැරදිකරුවන් නිවැරැදිකරුවන් කරන්න දරන උත්සාහය දකින විට අවංකයෙන්ම දැනෙන්නේ විශාල දුකක්. ඔබතුමා හිතනවාද? මම මේ කරන්නේ පහසු දෙයක් කියා. තාත්තා මිය ගිය දවසේ ඉඳන් අද වෙනකං අම්මා ඉන්නේ ඇඬ කඳුලෙන්, මේ ළඟදී මාව මරන්න කොන්ත්‍රාතුව කරලියට පැමිණි දවසේ ඉඳන් ඇය හැමදාම අඬ අඬා මට කියන්නේ මට තාත්තිත් නැති වුණා ඔයාවත් නැති කරගන්න බෑ. අපට කිසිම සාධාරණයක් වෙන්නේ නෑ. ඒ මේ රටේ යන විදිහ. ඔයා රටකට ගිහින් ජීවිතය බේරා ගන්න කියලයි. මම අම්මාට හැමදාම කියන්නේ මැරෙන්න තියෙන වෙලාවට මැරෙයි අම්මෙ, මට තාත්ති නැති වුණායි පස්සේ ජීවිතේ අරමුණක් නෑ. තාත්ති වෙනුවෙන් සාධාරණය ඉල්ලන්න ගිහින් මැරෙනවා නම් මට එය ආඩම්බරයක් කියායි. ජනාධිපතිතුමනි මම මාසයකට අඩුම තරමේ 3 වරක්වත් මගේ තාත්තාගේ මිනීමරුවන් ඇස් දෙක දකිනවා, ඒ මිනී මරුවන් අපි දිහා බලං ඉන්නේ මහා වීරකමක් කළා වගේ. මගේ පියාගේ ඔළුව කුඩු වෙන්න වෙඩි තියපු පුද්ගලයා දකින දකින වාරයක් පාසා මගේ පියාගේ ඇඟට උණ්ඩ 29 පත්තු කළ ඒ මිනීමරුවන් දකින දකින වාරයක් පාසා මට මතක් වෙන්නේ මගේ තාත්තා ලේ විලක් මැද වැටී සිටින ආකාරය. ඒ සමගම මට මගේ පියාගේ ඒ රත්තරන් මුහුණ ලේවලින් වැසී සිටිනවා මැවි මැවී පෙනෙනවා. ඔබතුමා මොහොතකටම ඔබතුමාගේ දරුවන් 3 දෙනා මා සිටින තැන කියලා හිතලා බලන්න. අද මට වෙලා තියෙන මෙම අසාධාරණය ඔවුන්ට වුණානම් ඔබට කෙසේ දැනෙයිද? ඔබ මියගොස් ඔබත් බිරිඳ ඇතුළු දරුවන්ට මෙම වෙන අසාධාරණකම් ඉවසාගත නොහැකිව උදේ ඉඳන් රෑ වෙනකම් අඬ අඬා හූල්ලමින් සිටිනවා. දැක දැක ඔබට කිසිම දෙයක් කරගත නොහැකි නම් ඔබට කෙසේ දැනෙයිද? මගේ පියා අද කොහේ හරි ඉඳන් මමත්, අම්මත්, මල්ලීත් මේ අසාධාරණකම් හමුවේ වැටී සිටින අගාධය දැකීමෙන් මොනතරම් කනගාටු වෙනවා ඇත්ද?

ජනාධිපතිතුමනි, අද හිරුණිකා ප්‍රේමචන්ද්‍ර යන චරිතයම වේදිකාවට එන්නේ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර යන චරිතය වේදිනවේ සමුගෙන යද්දී. අද රට මාව හඳුන්වන්නේ පියා මිය ගිය පියාගේ මරණයට සාධාරණයක් ඉල්ලා සටන් වදින දියණියක් යනුවෙන්. ඒත් මේ පියකුගේ මරණයෙන් අසාධාරණයකට මුහුණ දෙන එකම දියණිය නොවෙයි. මගේ පෙර පිනකට මට අද වේදිකාවක් ලැබී තිබෙනවා. මගේ අදහස් ප්‍රකාශ කරන්නට, ඒත් තමන්ගේ පුතා, පියා, සහෝදරයා, සැමියා අසාධාරණ ලෙස අතුරුදහන් කෙරවූ, ඝාතනය කළ මව්වරුන්, දූවරුන් බිරින්දෑවරු අද කොතෙකුත් ඇත්ද? ඔවුන්ට මට වගේ මෙසේ අදහස් ප්‍රකාශ කිරීමට ශක්තියක් හෝ අයිතියක් නැතිවී ඇති මොහොතක මා මේ ගෙනයන සටන හුදෙක් මාගේ පියා පමණක් නොව, ඔහු සමගම මියගිය දමිත, කුමාර සහ හෂීම් යන අයද තුවාල ලැබූ ගාමිණී යන අය අනෙකුත් මේ රටේ අසාධාරණය මරණවලට මුහුණ දුන් සියලුම පියවරුන් සහෝදරවරුන් වෙනුවෙන්ද ගෙන යන සටනක් බවට ඔබතුමාට කිව යුතුයි. අද මගේ පියාට සාධාරණයක් සිදු වුවහොත් රටේ අනෙක් අසාධාරණය ලක් වූ පවුල්වලට, දියණියන්ටද යන්තමින් හෝ නීතිය පිළිබඳ විශ්වාසයක් ඇති වේවි. එසේත් නැත්නම් මේ රටට අවසානයේ කුමක් වේවිද කිව නොහැකියි.

ජනාධිපතිතුමනි, රටක නීතිය ඒ රටේ ජනතාව සියලුම දෙනා මෙන්ම නීති සම්පාදනය කරන පුද්ගලයන්ටද සමානව බලපායි. The Rule of law යනුවෙන් Dicey 1885 සඳහන් කලේ නීතිය සියලු දෙනාටම ඉහළින් පවතින උත්තරීතර දෙයක් ලෙසිනි. ඒත් අද ශ්‍රී ලංකාවේ එය හාත්පසින්ම වෙනස් වූවකි. මැර බලය මුදල් බලය හා දේශපාලය බලය අද නීතියට ඉහළින් වැජඹේ. මෙය ඉතාමත් කනගාටුදායි කාරණයකි. සාමාන්‍ය ජනතාවම මේ මැර බලය මුදල් බලය හා දේශපාලන බලය ඉදිරියේ සාධාරණයක් ඉටු කරගත නොහැකි තත්ත්වයක් උදා වී ඇත.

ජනාධිපතිතුමනි ඔබ මෙන්ම රටේ අනෙකුත් සියලුම වගකිව යුතු අංශ අද මේ පරිහරණය කරන්නේ ජනතා පරමාධිපත්‍යයයි. ජනතාව විශ්වාස කරමින් ඔබතුමා ඇතුළු සියලුම දෙනාට දී ඇති බලය ජනතාව වෙනුවෙන් සාධාරණ පාවිච්චි කිරීම ඔබසතු වගකීමකි. එබැවින් මා ඔබතුමා. මේ ලිපියෙන් මතක් කර දෙන්නේ ජනතා පරමාධිපත්‍ය බලය සාධාරණව ජනතාව වෙනුවෙන් පරිහරණය කරන ලෙසයි.

සාධාරණය අයදින්නට මාගේ පියා කිසිම වරදක් කර නැත. වරද කරපු පාර්ශ්වය අනෙක්

පැත්තට වරද දමන්නට මොන උත්සහකළත් රටේ ජනතාව හා ලෝක පාලක දෙවියන් සත්‍ය කුමක්දැයි දන්නේය. ඒ වගේම ඔබතුමාගේ හෘදසාක්ෂියද සත්‍ය කුමක්ද කියා දන්නේය. ඔබතුමාට මා පවසා සිටින්නේ බෞද්ධයකු ලෙස සත්‍යයට ඉඩ දෙන්න. අනෙකුත් ගැටලු ඉබේම විසදේවි. මේ ලිපිය මාගේ දෙවන මෙන්ම අවසාන ලිපියද විය හැකියි. මා මේ රට තුළ ගන්නා අවසාන උත්සායද මෙයයි. රටේ උත්තරීතරය මෙන්ම මෙම සිද්ධි මාලාව හොඳින්ම දන්නා අයකු වන ඔබතුමාට මෙම ලිපිය ලියන මා බලාපොරොත්තු වන්නේ විධායක බලය හිමි එකම පුද්ගලයා ලෙස ඔබ යුක්තිය සාධාරණයට ඉඩ දෙයි යන බලාපොරොත්තුවෙනි. රටක සංවර්ධන ක්‍රියාවලිය කෙසේ යහපත් වුවත් ආගම දහමට ගරු කරන ජනතාවක් සිටින එකම රට ලෙස පුරාජේරු නැගුවත් රටක නීතිය සාධාරණ නැත්නම් මේ මොන දර්ශනපාඨකවලින් ඇති වැඩක් නැත. රටේ අනාගතය භාර දැන් රට කරන පුද්ගලයන්ට නොව අපටය. මෙසේ තව කාලයක් මේ රට පවත්වාගෙන ගියහොත් අපට රටක් කියන්නට දෙයක් ඉතිරි වෙන්නේ නැත. හෙට මාව පැහැරගෙන ගියත් කපාකොට පොහොර මල්ලක දමා කොහෙන් හෝ හමු වුවත් මගේ පියාට මෙන් මගේ ඔළුවත් වෙඩි තිබ්බත්, ඒ මියයන්නේ ඔබට රටේ ජනතාවම හිතන්නට යමක් ඉතිරි කරමිනි. ඒ දේ සිතෙන් සිතා ක්‍රියාත්මක නොවන්නේ නම් මා මේ ලියන ලිපියෙන් වැඩක් වන්නේ නැත. මෙහි සඳහන් සියලුම කරුණු සත්‍ය කරුණුයි. මේ ලිපිය කාගේවත් බලපෑමකට වුවමනාවට ලියූ ලිපියක් නොවන අතර මාගේ සිතේ තිබෙන සියලුම දේ මා මේ ලිපියට එක් කළෙමි. ජනාධිපතිතුමනි දැන් ඔබේ වාරයයි. ඔබ තීරණය කරන්න මෙය කියවා ඉරා පසෙක දමනවාද කෝපගෙන ක්‍රියාත්මක වෙනවාද? දෙතුන් පාරක් නොව දහස් වරක් සිතා සාධාරණය ඉෂ්ඨ කරනවාද? මන්ද භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍රට සාධාරණය ඉටු වුවවොත් අපේ රටේ අසාධාරණ අමු අමුවේ මරණය පත්ව යට ගන්නට උත්සහ කරන විශාල පිරිසකට සාධාරණයේ සේයාව යම්කිසි දුරකට හෝ පෙන්වා දේවි.

හිරුණිකා ප්‍රේමචන්ද්‍ර